ගැත්තෙකු පාපයක් සිදු කරයි. පසු ව ඔහු ‘අහෝ දෙවියනි! මාගේ පාපයට මට සමාව දෙනු මැනව!’

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තම පරමාධිපති ගැන පවසා සිටි කරුණක් සම්බන්ධයෙන් හෙතෙම මෙසේ පවසා සිටියි: “ගැත්තෙකු පාපයක් සිදු කරයි. පසු ව ඔහු ‘අහෝ දෙවියනි! මාගේ පාපයට මට සමාව දෙනු මැනව!’ යැයි පවසයි. එවිට උත්තරීතර උත්කෘෂ්ඨ අල්ලාහ්: ‘මාගේ ගැත්තා පාපයක් සිදු කර ඇත. පාපයට සමාව දෙන, පාපය හේතුවෙන් ඔහු ව ග්රහණය කරන පරමාධිපතියකු සැබැවින්ම සිටින බව ඔහු දැන සිටියි.' යැයි පවසයි. පසුව ඔහු නැවතත් පාපය සිදු කර, 'මාගේ පරමාධිපතියාණනි! මාගේ පාපයට මට සමාව දෙනු මැනව!' යැයි පවසයි. එවිට ද උත්තරීතර උත්කෘෂ්ඨ අල්ලාහ්: ‘මාගේ ගැත්තා පාපයක් සිදු කර ඇත. පාපයට සමාව දෙන, පාපය හේතුවෙන් ඔහු ව ග්රහණය කරන පරමාධිපතියකු සැබැවින්ම සිටින බව ඔහු දැන සිටියි' යැයි පවසයි. ඔහු නැවතත් පාපය සිදු කර 'මාගේ පරමාධිපතියාණනි! මාගේ පාපයට මට සමාව දෙනු
මැනව!' යැයි පවසයි. එවිට ද උත්තරීතර උත්කෘෂ්ඨ අල්ලාහ්, ‘මාගේ ගැත්තා පාපයක් සිදු කර
ඇත. පාපයට සමාව දෙන, පාපය හේතුවෙන් ඔහු ව ග්රහණය කරන පරමාධිපතියකු සැබැවින්ම සිටින
බව ඔහු දැන සිටියි. ඔබ කැමති දෑ සිදු කරන්න. සැබැවින්ම මම ඔබට සමාව දෙමි' යැයි පවසයි. [صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තම පරමාධිපති ගැන මෙසේ පවසා සිටියි: සැබැවින්ම ගැත්තෙක් පාපයක් සිදු කළ පසු ව ඔහු "අල්ලාහුම්ග්ෆිර්ලී දන්බී" (අහෝ දෙවියනි! මාගේ පාපයට මට සමාව දෙනු මැනව!) යැයි පවසයි. එවිට උත්තරීතර අල්ලාහ්: ‘මාගේ ගැත්තා පාපයක් සිදු කර ඇත. පාපයට සමාව දෙන, පාපය වසන් කරන, ඔහුගෙන් එය ඉවත් කරන පරමාධිපතියකු සැබැවින්ම සිටින බව ඔහු දැන සිටියි.' යැයි පවසයි. පසුව ගැත්තා නැවතත් පාපකම් සිදු කර පසු ව ඔහු "අල්ලාහුම්ග්ෆිර්ලී දන්බී" (අහෝ දෙවියනි! මාගේ පාපයට මට සමාව දෙනු මැනව!) යැයි පවසයි. එවිට අල්ලාහ්: ‘මාගේ ගැත්තා පාපයක් සිදු කර ඇත. පාපයට සමාව දෙන, පාපය වසන් කරන, ඔහුගෙන් එය ඉවත් කරන එසේ නැතහොත් ඔහුට දඬුවම් කරන පරමාධිපතියකු සැබැවින්ම සිටින බව ඔහු දැන සිටියි. සැබැවින්ම මම ඔහුට සමාව දුනිමි' යැයි පවසයි. පසුව ගැත්තා නැවතත් පාපකම් සිදු කර, පසු ව ඔහු "අල්ලාහුම්ග්ෆිර්ලී දන්බී" (අහෝ දෙවියනි, මාගේ පාපයට මට සමාව දෙනු මැනව!) යැයි පවසයි. එවිට අල්ලාහ්: ‘මාගේ ගැත්තා පාපයක් සිදු කර ඇත. පාපයට සමාව දෙන, පාපය වසන් කරන, ඔහුගෙන් එය ඉවත් කරන එසේ නැතහොත් ඔහුට දඬුවම් කරන පරමාධිපතියකු සැබැවින්ම සිටින බව ඔහු දැන සිටියි. සැබැවින්ම මම ඔහුට සමාව දුනිමි. එබැවින් ඔහු පාපයක් කරන සෑම විටම ඔහු පාපය අතහැර පසුතැවිලි වී නැවත ඒ වෙත යොමු නොවීමට අධිෂ්ඨාන කර ගන්නා තාක් කල් ඔහුට අවශ්ය ඕනෑම දෙයක් සිදු කරත්වා' යැයි පවසයි. නමුත් ඔහුගේ සිත ඔහු අබිබවා ගොස් නැවතත් ඔහු පාපයට වැටේ. ඔහු මෙය කරන තාක් කල්, ඔහු පව් කර පසුතැවිලි වේ. එබැවින් මම ඔහුට සමාව දෙන්නෙමි, මන්ද පසුතැවීම ඊට පෙර පැවති දෑ විනාශ කරන බැවිනි.

http://www.sunnah.global/hadeeth/si/show/4817